# 20 වැනි සියවසේ මුල්භාගයේ ගත්කරුවකුගේ සිත්හි උපන් විශ්‍රාන්තිය

පී. වයි හරිනි දිල්ෂානි

මෙය ජීවන චරිතයක් නොවේ, නව කථාවක්ද නොවේ, මතක වතක්ද නොවේ. කුඩා වියෙහි සිට මා කළ කම්, දෙඩූ දෙඩුම්, ඇසූ විත්ති, දුටු දැකුම්, සිතූ සිතුම් හා පැතූ පැතුම් ද සිහි කරන්ටත් ලියන්ටත් කළ වෑයමෙහි විපාක ඵලයකි." උපන්දා සිට "යනු ඒ විපාක -ඵල හැඳින්වෙන සංකේතයක් මිස නමක් නොවේ. මීට අවුරුදු විස්සකට පමණ පෙර මා "අපේ ගම" ලියුවේ මගේ ළමා විය සිතින් අල්ලා බඳ ගන්නා තරම් ආසාවකිනි. ළමා කාලයේ මා ඇසූ වදන්, දෙඩූ දෙඩුම්, කළ සෙල්ලම් මතක් කරන්නට වෑයම් කිරීමෙන් මගේ කය වැඩුණේ අනික් සිංහල ගැමියෙකුගේ කය වැඩුණාක් මෙනි. සිත වැඩුණේ වෙනස් විදියකිනි. උසස් විදුහලකින් හෝ පිළිවෙළින් උගැන්මක් නොලත් මා දැනුම ලැබූ අත්දැකීමෙන් හා ආසාවෙන් පොත් කියවීමෙනි.

...ඔහු තමා කළ කාරිය "අධ්‍යාපනය" "ශික්ෂණය" යන පදවලින් හැඳින්වීමට නොසිතා "අකුරු ඉගැන්වීම" යන දෙපදයෙන් හැඳින්වීමෙන් හෙළිවන්නේ ඔහුගේත් ගැමි ජනකායගෙත් නිහතමානකමයි. ගමේ ළමයි කෙළි සෙල්ලමෙන්, ගස් කොළන් හා සතුන් බැලීමෙන්, උන්ට හිංසා කිරීමෙන්, මැටි අනා එයින් නොයෙක් රූප ඇඹීමෙන්, ලී කෑලි පුරද්දා සෙල්ලම් කරත්ත සෑදීමෙන් ද අත් පා හුරු කොට ගත්හ. මෙයින් ඔවුහූ ඉන්ද්‍රියයන් තියුණු කරන උගැන්මක් නිතැතින් ලැබූහ. ගුරුන්නාන්සේ අකුරු ඉගැන්නුවේ මේ අත්දැකීමෙන් උගැන්මක් ලබන දරුවන්ටයි.
අඟල් නමයක් පමණ දිග පොල්පිති කෑල්ලකින් තනා ගත් හරකාගේ නැහැය විද නාස් ලණුවක් දමා තවත් ලණු දෙපටකින් ඇදගෙන යාමෙන් මා ලත් ප්‍රීතිය මට බාල මගේ ඥාති සහෝදරයා, ඩාර්ලි චඃ ' කියමින් ඌට කෝටුවකින් තැළීය. බට තුවක්කුවෙන් ඉලක්කයට වෙඩි තබන්නට මා හා මගේ යාළුවන්ද පුරුදු වුණේ පළමුව ගස්වල කොළ පසාරු කරගෙන යන සේ ඇපල විදීමෙනි. එක වෙඩිල්ලෙන් කොළ දෙකක් හෝ තුනක් පසාරු කරගෙන යන සේ ඇපලය විදින්නා ශූරයෙකිත්ව කොස් කොළ තොප්පිල කොස් කොළ පටි හා වාපන සේ එකට ඇදන ලද කොස් කොළද අපගේ යුද්ධ ඇඳුම් පැළඳුම් වීය. වෙරළෙහි රැස්වන ළමයින්ගෙන් සමහරු සෙල්ලම් කරති. පැල ඉදිරියෙහි බෙනවලින් එළියට එන කුඩා සුදු කකුළුවෝ උන්ගේ කතුරු අඬු උස්සාගෙන ඒ මේ අත දුවති. ඒ දිවීම ඔවුන්ගේ කෙළියක් විය යුතුයයි මම සිතුවෙමි. බෙනයෙන් උඩට එන කකුළුවෙක් කටින් ගත් සීන් මුදූ වැලි පිට කරයි....ගමදි කය වෙහෙසන සෙල්ලමින් ගඟේ ඔරු පැදීමෙන් බැදි වැදී පේර මාදන් අඹ කජු ආදිය කඩා ගෙන කෑමෙන් විනෝදයක් ලැබූ මම කොළඹට පැමිණ....මම ළමයින් නොව තරුණයන් ඇසුරු කරන්නට පටන් ගත්තෙමි. With Youth love is not a plant of slow growth; touch of a hand, glance of an eye awaken the soul of love into life.

මාර්ටින් වික්‍රමසිංහ, උපන්දා සිට, සීස සරස පෞද්ගලික සමාගම, 18/3, කිරි මණ්ඩල මාවත නාවල රාජගිරිය ISBN 978-955-0201-86.